ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය : PS/PCA/11/PMT/5 - ii

චක්‍රලේඛ අංකය : PS/PCA/Circular/2/2023

2023 නොවැම්බර් මස 13 වන දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ විෂයන් භාර සියළුම අතිරේක ලේකම්වරුන්

<u>අයවැය විවාදය පිළිබඳ වැඩසටහන - **2024**</u>

පාර්ලිමේන්තු කටයුතු කාරක සභාව විසින් අනුමත කර ඇති අයවැය කාල සටහන අනුව, 2023 නොවැම්බර් මස 13 වන දින ගරු ජනාධිපතිතුමා විසින් මුදල් අමාත්‍යවරයා වශයෙන් අයවැය කථාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව දෙවන වර කියවීමේ විවාදය 2023 නොවැම්බර් මස 14 වන අඟහරුවාදා දින පෙ.ව. 9.30ට ආරම්භ කර, නොවැම්බර් මස 21 වන අඟහරුවාදා දින දක්වා පැවැත්වෙනු ඇත. අයවැය දෙවනවර කියවීම පිළිබඳ ඡන්ද විමසීම 2023 නොවැම්බර් මස 21 වන අඟහරුවාදා දින ප.ව. 5.30ට සිදු කිරීමට නියමිතය. අයවැය කාරක සභා විවාදය 2023 නොවැම්බර් 22 දින සිට 2023 දෙසැම්බර් මස 13 වන දින දක්වා පැවැත්වීමට නියමිත අතර, අයවැය තුන්වන වර කියවීමේ ඡන්ද විමසීම 2023 දෙසැම්බර් මස 13 වන දින ප.ව. 5.30ට පැවැත්වීමට නියමිතය. අයවැය විවාදය පිළිබඳ වැඩසටහනේ පිටපතක් ඔබගේ දැනගැනීම සඳහා මේ සමඟ අමුණා ඇත.

02. මෙම කාලය තුළ ගරු අමාත්‍යවරුන්හට නිල හෝ පෞද්ගලික විදේශ සංචාර සැලසුම් නොකල යුතු අතර, විශේෂ අවස්ථාවන් සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය හා තානාපති කාර්යාල හරහා අදාළ නියෝජනය ලබාදිය හැකි බව වැඩිදුරටත් සඳහන් කරනු කැමැත්තෙමි.

03. එබැවින්, අත්‍යාවශ්‍ය කටයුතු හැර වෙනත් විදේශ සංචාරවලට මෙම කාලය තුළ සහභාගීවීමෙන් වලකින ලෙස ගරු අමාත්‍යවරුන්, අමාත්‍යාංශ යටතේ පවතින ආයතන හා දෙපාර්තමේන්තු වල ප්‍රධානීන්, සභාපතිවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දැනුම්වත් කිරීමට ද කටයුතු කරන්න.

04. තවද, අමාත්‍යාංශ සඳහා නියමිත කාරක සභා අවස්ථාවේ විවාද දිනයන්හි අදාළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගීත්වය අත්‍යාවශ්‍ය වන අතර, සෙසු විධායක / මාණ්ඩලික මට්ටමේ නිලධාරීන් අමාත්‍යාංශයේ, දෙපාර්තමේන්තුවේ හෝ ආයතනවල රැඳිසිටීමට වගබලා ගතයුතු බව වැඩිදුරටත් දන්වමි.

ඊ එම් එස් බී ඒකනායක
ජනාධිපති ලේකම්

දුරකථන : +94 11 2354420 ෆැක්ස් : +94 11 2446657
විද්‍යුත් තැපෑල : prsec@presidentsoffice.lk

පිටපත් - 1. අග්‍රාමාත්‍ය ලේකම්
2. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
3. පාර්ලිමේන්තුවේ සභානායක ලේකම්
4. පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ලේකම්

} කරු. දැ.ගැ.පි.

ගාලු මුවදොර, කොළඹ 01.
காலி முகத்திடல், கொழும்பு 01.
Galle Face, Colombo 01.

දුරකථන / தொலைபேசி / Telephones: +94 (0) 11 2354418, +94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: +94 (0) 11 2446657
ඊ - තැපැල / மின்னஞ்சல் / E-mail: prsec@presidentsoffice.lk

## 2024 - අයවැය විවාදය පිළිබඳ වැඩසටහන

**2023 නොවැම්බර් 13 සඳුදා මධ්‍යාහ්න 12.00 - අයවැය කථාව**
**(විසර්ජන පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම**

**දෙවැනිවර කියවීමේ විවාදය**

| | | |
|---|---|---|
| **2023 නොවැම්බර් 14** අඟහරුවාදා | | **වෙන් කළ දින ගණන හතකි (07)** |
| 15 බදාදා | | **වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න (දිනකට ප්‍රශ්න 05කි)** **පෙ.ව. 9.30 සිට පෙ.ව. 10.00 දක්වා** |
| 16 බ්‍රහස්පතින්දා | | **විවාදය පැවැත්වෙන කාලය** |
| 17 සිකුරාදා | | **පෙ.ව. 10.00 සිට ප.ව.6.00 දක්වා** **සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව** |
| 18 සෙනසුරාදා | | **ප.ව. 6.00 සිට ප.ව. 6.30 දක්වා** *(නොවැම්බර් 21 අඟහරුවාදා හැර)* |
| 20 සඳුදා | | **(සභාව කල්තබන අවස්ථාවේ ප්‍රශ්න නොමැත)** |
| 21 අඟහරුවාදා | | (දිවා ආහාර විවේකය - ප.ව. 12.30 සිට ප.ව. 1.00 දක්වා) (සිකුරාදා දින - දිවා ආහාර විවේකය - ප.ව. 12.30 සිට ප.ව. 1.30 දක්වා) |

**දෙවැනිවර කියවීමේ ඡන්ද විමසීම නොවැම්බර් 21 අඟහරුවාදා ප.ව. 5.30 ට සිදු කෙරේ.**

**කාරක සභා අවස්ථාවේ විවාදය**

| | | |
|---|---|---|
| **2023 නොවැම්බර්** | 22 | බදාදා |
| | 23 | බ්‍රහස්පතින්දා |
| | 24 | සිකුරාදා |
| | 25 | සෙනසුරාදා |
| | 27 | සඳුදා |
| | 28 | අඟහරුවාදා |
| | 29 | බදාදා |
| | 30 | බ්‍රහස්පතින්දා |
| දෙසැම්බර් | 01 | සිකුරාදා |
| | 02 | සෙනසුරාදා |
| | 04 | සඳුදා |
| | 05 | අඟහරුවාදා |
| | 06 | බදාදා |
| | 07 | බ්‍රහස්පතින්දා |
| | 08 | සිකුරාදා |
| | 09 | සෙනසුරාදා |
| | 11 | සඳුදා |
| | 12 | අඟහරුවාදා |
| | 13 | බදාදා |

**වෙන් කළ දින ගණන දහනවයකි (19)**

**වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න (දිනකට ප්‍රශ්න 05කි)**
**පෙ.ව. 9.30 සිට පෙ.ව. 10.00 දක්වා**

**විවාදය පැවැත්වෙන කාලය**

**පෙ.ව. 10.00 සිට ප.ව. 6.00 දක්වා**

**සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව**

**ප.ව. 6.00 සිට ප.ව. 6.30 දක්වා**
*(දෙසැම්බර් 13 බදාදා හැර)*

**(සභාව කල්තබන අවස්ථාවේ ප්‍රශ්න නොමැත)**

(දිවා ආහාර විවේකය - ප.ව. 12.30 සිට ප.ව. 1.00 දක්වා)
(සිකුරාදා දිනවල - දිවා ආහාර විවේකය -ප.ව. 12.30 සිට ප.ව. 1.30 දක්වා)

**තුන්වැනිවර කියවීමේ ඡන්ද විමසීම දෙසැම්බර් 13 බදාදා ප.ව. 5.30 ට සිදු කෙරේ.**

ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය,
පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

**2023 ඔක්තෝබර් 20 වෙනි දින.**